සමග අනුකූල වන ලෙස හා නව තාක්ෂණය යොදා ගන්නා ලෙස (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු වෙත විධාන කිරීම; සහ

(ආ) යම් ගුවන්විදුලි සංඛ්‍යාතයක් වෙනස් කිරීමට පෙරාතුව ම වූ සාධාරණ කාලසීමාවක දී අදාළ තැනැත්තාට ලිඛිත දැන්වීමක් ලබාදීමෙන් පසුව, ඒ සඳහා හේතු දක්වමින් ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරිම,

සඳහා බලතල තිබිය යුතු ය.

(3ආ) (3අ) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සඳහන් ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරීමෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින් ඒ ඡේදයේ සඳහන් එකී දැන්වීම ලැබීමෙන් සති තුනක් ඇතුළත කොමිෂන් සභාව වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(3ඇ) කොමිෂන් සභාව විසින්, එම අතෘප්තියට පත් තැනැත්තාගේ එකී වෙනස් කිරීම සම්බන්ධයෙන් වන යම් විරෝධතාවයක් සඳහා කරුණු කියාපෑමට සාධාරණ අවස්ථාවක් ලබාදීමෙන් පසු, කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබූ තැනැත්තා වෙත එකී අභියාචනය ලැබුණු දින සිට සති තුනක් ඇතුළත ස්වකීය තීරණය සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(3ඈ) (3අ) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ සංඛ්‍යාත බලපත්‍රය වෙනස් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ ද එම අදාළ තැනැත්තාට යම් වන්දියක් ගෙවීමට කොමිෂන් සභාව විසින් සලකා බලනු ලැබිය හැකි ය.”; සහ

(6) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

